# ලයිට් ඔෆ් ඒෂියා කෘතියෙහි නිදර්ශන චිත්‍රවලින් පිළිබිඹු වන ආධ්‍යාත්මික කලාවේ නව ප්‍රවණතා

කේ.එල්.ජී.සී. තුෂාර[1]

## හැඳින්වීම


දේශීය පන්සල් චිත්‍රය ඇසුරු කොට වැඩුණු සාම්ප්‍රදායික නිදර්ශන චිත්‍ර කලාව ආධ්‍යාත්මික සන්නිවේදනය සඳහා භාවිත වූ ප්‍රශස්ත ඇඳීම් ක්‍රමය යි. වර්තමානයේ දී චිත්‍ර කලාව සහ එහි මතවාද කොතෙක් දියුණු වුවද ආධ්‍යාත්මික සන්නිවේදනයේදී අමූර්ත කලාවන් (Abstract Art) සහ වෙනත් නව කලාවන් ආභාෂය කොටගත් නව ඇඳීම් ක්‍රම සහ සංකල්ප භාවිතය කෙරෙහි දේශීය චිත්‍ර කලා සමාජය පසුගාමී අදහසක් දරයි. මෙතෙක් ඒ පිළිබඳ විධිමත් පර්යේෂණයක් සිදුව නොමැති පසුබිමක බෞද්ධ දර්ශනය පදනම් කොටගත් ආධ්‍යාත්මික කලාවට නව සංකල්ප ප්‍රවේශ වන ආකාරය එඩ්වින් ආර්නෝල්ඩ් විසින් රචිත ද ලයිට් ඔෆ් ඒෂියා කෘතියෙහි සුමන දිසානායකගේ නිද්ර්ශන චිත්‍ර ඇසුරින් විමසීම මෙම පර්යේෂණයේ අරමුණයි. එමගින් නව කලා ධාරාවන් ආධ්‍යාත්මික සන්නිවේදනයේ දී යොදා ගත හැකි ආකාරය පිළිබඳ ව අවශ්‍යතාවක් ඉටු වන අතර ඊට නව ප්‍රවේශයක් ද ලබාගත හැකි වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

එඩ්වින් ආර්නෝල්ඩ් විසින් රචිත ''ද ලයිට් ඔෆ් ඒෂියා'' කෘතිය 1995 දී ප්‍රකාශ වූවකි. ඉංග්‍රීසි පද්‍ය ආශ්‍රයෙන් බුද්ධ චරිතය පිළිබඳ නිර්මාණාත්මක අදහසක් ගොනු කරන මෙම කෘතියෙහි ''මායාගේ සිහිනය'' කෘතියේ සිට ''පරිනිර්වාණය'' දක්වා නිදර්ශන චිත්‍ර දහයක් මෙන් ම තේමාවට අදාළ පිටකවරයක් චිත්‍ර ශිල්පී සුමන දිසානායක විසින් නිර්මාණය කර ඇත. ගුණාත්මක සහ සංඛ්‍යාත්මක මිශ්‍ර පර්යේෂණයක් වන මෙහි සිතුවම්වල ඇති ලක්ෂණ විස්තරාත්මක දත්ත ፡Descriptive Data) වර්ගයට අයත් වේ. එම චිත්‍රවල ඇති දේශීය පන්සල් චිත්‍ර කලා ලක්ෂණ, අමූර්ත කලා, රුසියානු ආභාෂය, රේඛා භාවිතය, සංරචන භාවිතය සහ වර්ණ ඇතිරීම් ක්‍රම මෙන් ම වර්ණ මාලා ආධ්‍යාත්මික කලාවට සරිලන ආකාරයෙන් යොදා ගැනීම පිළිබඳ වෙන් වෙන් වශයෙන් අධ්‍යයනය කරනු ලැබේ. මෙහි දී සාම්ප්‍රදායික චිත්‍ර ඇඳීමේ ක්‍රම සහ තාක්ෂණය ද නව කලා ධාරාවන්ගේ ආභාසයෙන් ඒවා සංවර්ධනය කිරීමේ ප්‍රයත්නයන් ද සංසන්දනාත්මක ලෙස අධ්‍යයනය කෙරේ. මෙම නිදර්ශන චිත්‍රවල විග්‍රහයන් මගින් එහි ඇති අන්තර් ඥානය (Insight) සොයාගැනීම ප්‍රධාන වශයෙන් අපේක්ෂිතය.

1. බාහිර කථිකාචාර්ය, දෘෂ්‍ය කලා පීඨය, සෞන්දර්ය විශ්වවිද්‍යාලය, කොළඹ.
gamage.chaminda@email.com

**සාකච්ඡාව**




Arnold, Edwin (1995), The Light Of Asia, New Delhi: Navrag

මෙම පර්යේෂණයේ දී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ලබන්නේ සාම්ප්‍රදායික පන්සල් චිත්‍රයෙන් ප්‍රකාශිත බෞද්ධ දාර්ශනික අදහස් නව කලා ධාරාවන්ගේ ආභාසයෙන් සංවර්ධනය කිරීමේ ආකාරයයි. එසේ ම මෙම සිත්තරාගේ අනන්‍යතාව සහිතව නව ශෛලියක් දක්වා එය වර්ධනය කිරීම මෙන් ම ආධ්‍යාත්මික කලාව සඳහා උචිත අයුරින් යොදා ගැනීම පිළිබඳ වයි. චිත්‍ර ශිල්පී සුමන දිසානායක මෙම කෘතියෙහි නිර්මාණය කරනු ලබන නිදර්ශන චිත්‍රවල මූලික පසුබිම වන දේශිය පන්සල් චිත්‍රයෙහි ආභාසය සහ එහි වටිනාකම් පිළිබඳ මනා අවබෝධයක් ද ඒවායෙහි ගුණාත්මක ස්වරූපය ආරක්ෂා කරගැනීමේ වගකීමෙන් ද බැඳි සිටී. ප්‍රධාන වශයෙන් සිත්තරා විසින් භාවිත ඇඳීම් ක්‍රමය දේශීය පන්සල් චිත්‍රයේ මූලික පදනම ඇසුරු කොට ගනී. එහෙත් ඊට භාවිත වර්ණ සහ ඒවා යොදාගැනීමේ ක්‍රම බටහිර වර්ණ ගැන්වීම් හා සමාන බවක් පෙනේ. චිත්‍රයේ මූලික ආභාසය සාම්ප්‍රදායික පන්සල් චිත්‍රයේ ලක්ෂණවලින් සමන්විත වුව ද වර්ණ පිරිමැද ඇඳීමෙන් වියුක්තව ඒවා වර්ණ පදාස අනුව නිර්මාණය කරයි. රූප ඇඳිමේදීත් වර්ණ පදාස යොදා ගැනීම දේශීය සාම්ප්‍රදායික චිත්‍රයේ දක්නට නොමැති ලක්ෂණයකි. ඉන්දියානු කලාවේ ආභාසයන් ද චිත්‍ර ශිල්පී දිසානායකගේ රුසියානු අධ්‍යාපනයෙන් ලත් දැනුම මත එම නිදර්ශන චිත්‍රවලින් උකහා ගත් ලක්ෂණ ද අමූර්ත කලාවේ (Abstract Art) සහ අමූර්ත ප්‍රකාශනවාදයේ (Abstract Expressionism) ඇති සහ එම මොහොතේ ගන්නා ලද තීරණ අනුව ක්‍රියාත්මක වීම් ද දක්නට ඇත (සේනාධීර, 1973). චිත්‍ර සංරචනයේ දී වමේ සිට දකුණට කියවෙන සාම්ප්‍රදායික පන්සල් චිත්‍රයේ ක්‍රමය අනුගමනය කරයි. එසේ ම නූතන කලා ධාරාවන්හි භාවිත අවකාශය පිළිබඳ අර්ථයන් ද යොදා ගනී. වර්ණ ප්‍රභේද භාවිතයේ දී සියුම් ගති ලක්ෂණ පවතින පරිදි සංරචනයේ සමබරතාව රකින ලා පැහැති වර්ණ සංරචනය පුරා පැවතීමට නිදර්ශන චිත්‍රයට ඉඩ සලසා ඇත. එහෙත් එවා නැවත නැවත වෙනස් කරමින් පරිපූර්ණ ලෙස ම නිමා කිරීමට වඩා කටු සටහන්වල ඇති දළ ස්වභාවයෙන් යුක්ත ව නිමා කිරීම ද නව කලා ධාරාවන්හි ලක්ෂණයකි. මෙම ග්‍රන්ථය පද්‍ය රචනා ආශ්‍රයෙන් රචනා කොට ඇති නිසාම බෞද්ධ දර්ශනයට අදාළ මෙම නිදර්ශන චිත්‍රවල ද කාව්‍යමය ස්වරූපයට ගැලපෙන සමස්ත සිදුවීම හකුලා දැක්වීමේ ක්‍රමයක් භාවිත කොට තිබේ. එසේ ම සමස්ත සිදුවීම තුළ සවිතරාත්මක ඇඳීම් (Method of Detail

Drawing) ක්‍රමයක් භාවිත කරයි. එම සියුම් විස්තර සාම්ප්‍රදායික පන්සල් චිත්‍රය ද ඉන්දියානු කලාවේ ඇති ලක්ෂණ සමඟ ද සමාන්තර බවක් පෙනේ. එක් එක් චිත්‍රයෙන් චිත්‍රයට එම සිදුවීමට ගැළපෙන ආකාරයේ සංරචනයක් ද වර්ණ ගැන්වීමේ ක්‍රම ද භාවිත කරයි. සාම්ප්‍රදායික පන්සල් චිත්‍රයෙන් නරඹන්නා විඳින සහ අවබෝධ කොට ගන්නා හරය ලබාදීමට මෙම නිදර්ශන චිත්‍ර තුළ ද චිත්‍ර ශිල්පී සුමන දිසානායකට හැකි වන්නේ ඔහු සතු දීර්ඝ කාලීන අත්දැකීම් සහ අධ්‍යයනයන් පදනම් කොටගෙන ය.

වගු අංක 01: ලයිට් ඔෆ් ඒෂියා කෘතියෙහි ඇතුළත් චිත්‍ර ඵලක සහ එවායේ ඇතුළත් නව කලා ධාරාවන්හි ආභාසය

| | |
|---|---|
| 01 මායාගේ සිහිනය<br>Maya's Dream<br>(Arnold,1995. p.4)' | නූතන සංරචනයකි සාම්ප්‍රදායික චිත්‍රයේ වැඩි වශයෙන් භාවිතා නොකරන කලු සුදු සහ අළු වර්ණ ද නිල් පැහැයේ ප්‍රභේදවලද එකතුවකි. එහෙත් වමේ සිට දකුණට ඇස මගින් කියැවෙන කථන ක්‍රමය භාවිත කරයි. |
| 02 සිදුහත් කුමාරොත්පත්තිය<br>Bırth of the Buddha<br>(Arnold,1995. p.8)' | මෙම චිත්‍රය වර්ණ ගන්වා ඇති ආකාරය සහ සංරචනය රුසියානු නිදර්ශන චිත්‍රවල ආභාසය සහිත බව පෙනේ එහි ආකර්ෂණය සහ ඉතා සතුටුදායක පුවතක් බව ප්‍රකාශ කිරීමට සිත්තරා විසින් යොදා ගන්නා ලද ඔහුට ආවේණික වර්ණ ගැන්වීම් ශෛලියකි. |
| 4 දුණු ශිල්ප දැක්වීම<br>The Archery Contest<br>(Arnold,1995. p.30)' | සාම්ප්‍රදායික පන්සල් චිත්‍රයේ එන රතු පැහැති පසුබිම භාවිත කරයි. සිදුහත් කුමරු සහිතව ශිෂ්‍ය කණ්ඩායම 21 දෙනෙකි ප්‍රධාන කාන්තා රූපයක් වම් පසින් ද චිත්‍රය තුළට නරඹන්නාට ප්‍රවේශ වීමට ඇති ඉඩක් ලෙස සැලකිය හැකි අවකාශයක් ද ඉතිරි කරයි. නව සංරචනයකි. |
| 08 මාර යුද්ධය<br>Mara's War<br>(Arnold,1995. p.118)' | අවස්ථාවට උචිත අයුරින් මෙම චිත්‍රය සම්පූර්ණ වශයෙන් ම අමූර්ත කලාවේ ලක්ෂණවලින් නිර්මාණය කර ඇත. පැබ්ලෝ පිකාසෝ ගේ ඝනිකවාදී චිත්‍ර රටාවන් සිහියට නංවයි. |
| 10 පරිනිර්වාණය<br>Parinibbāna<br>(Arnold,1995. p.176)' | සංරචනය වමේ සිට දකුණට කියැවෙන සාම්ප්‍රදායික කථන ක්‍රමය වෙනස් කොට බුදුන් වහන්සේගේ හිස වම් පසින් දැක්වෙන ආකාරයෙන් නිර්මාණය කළ සංවේගදායක අවස්ථාවකි. එහි ඇති වෘක්ෂ රෝස පැහැයෙන් ද මලානික ස්වරූපයෙන් ද දක්වා ඇත. |

**නිගමනය**

'ලයිට් ඔෆ් එෂියා' කෘතියෙහි සුමන දිසානායකගේ නිදර්ශන චිත්‍ර මගින් බෞද්ධ දාර්ශනික සන්නිවේදනය සඳහා නූතන කලා ධාරාවන් නිර්මාණාත්මක අයුරින් යොදා ගන්නා ආකාරය පැහැදිලි වේ. මෙම කෘතියෙහි නිදර්ශන චිත්‍ර 10 ක් සහ තේමාවට

අදාළ පිටකවරයක් සහිත අතර එම සිතුවම් දේශීය පන්සල් චිත්‍ර, අමූර්ත කලාව, අමූර්ත ප්‍රකාශනවාදී කලාව, ඉන්දියානු සාම්ප්‍රදායික කලාව, රුසියානු නිදර්ශන චිත්‍ර වැනි පුළුල් කලාත්මක දැනුම් සම්භාරයක එකතුවකි. ඒවා අදාළ සිදුවීමට ගැළපෙන අයුරින් තෝරා ගන්නට සිත්තරා උත්සාහ දරා ඇත. මෙම අධ්‍යයනයේ දී නූතන කලාවේ බොහෝ විට දක්නට ඇති මධ්‍ය රූප සංරචන (Centre figure Composition)" මෙන් ම සාම්ප්‍රදායික චිත්‍රයේ රතු පසුබිම් මත චිත්‍රය ගොඩනැගීම් වැනි ලක්ෂණවල එකතුවක් ද අමූර්ත ප්‍රකාශනවාදී කලාවේ ඇති එම මොහොතේ ගන්නා ලද තීරණ සහිත වර්ණ ගැන්වීම් රටා ද හමු වේ. අමූර්ත කලාවේ පදනම වන මනස මූලික කොටගත් කලාවට අයත් සංකල්ප සංරචන තුළ ද වර්ණ ගැන්වීම්වලදී ද භාවිත කර ඇත (Balken, 2005). චිත්‍ර ශිල්පී සුමන දිසානායක විසින් ස්වකීය අනන්‍යතාව සහිතව නිර්මාණය කළ ආධ්‍යාත්මික සන්නිවේදනයට යෝග්‍ය නිර්මාණයන් ලෙස හැඳින්විය හැක්කේ මෙම නිර්මාණ තුළ බුදු දහම හෝ එහි සංකල්පවලට අනර්ථයක් සිදුවීමට ඉඩක් නොතබා එහි ඇති ගාම්භීර බව නිසඟයෙන්ම මතු වන ලෙස නිමවා තිබීමයි. ආධ්‍යාත්මික සන්නිවේදනයේ දී නූතන චිත්‍ර කලා දැනුම සහ සංකල්ප අර්ථාන්විතව සහ නිර්මාණශීලී අයුරින් යොදා ගත හැකි බව මෙම පර්යේෂණ තොරතුරු සනාථ කරයි. නූතන අර්ථ සන්නිවේදනය මගින් සාම්ප්‍රදායික පන්සල් චිත්‍රය ඇසුරින් ග්‍රන්ථ මුද්‍රණයට සීමා නොවන ඊට පරිබාහිර නව තාක්ෂණික මාධ්‍ය දක්වා පැතිර යාමේ ප්‍රවණතාවක් ඇති හෙයින් එම ක්ෂේත්‍ර ඔස්සේ ද මෙවන් පර්යේෂණ සිදු කිරීමේ අවස්ථා උදාවී ඇති බව දක්නට ලැබේ.

**මුඛ්‍ය පද:** අමූර්ත, ආධ්‍යාත්මික, නිදර්ශන චිත්‍ර, පන්සල් චිත්‍රල ශෛලිය

**ආශ්‍රිත ග්‍රන්ථ**

ඉලයප්ආරච්චි, එරික්. (1995). *ශ්‍රී ලංකාවේ නූතන චිත්‍ර මූර්ති කලාවේ නව ප්‍රවණතා.* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

*සිංහල විශ්ව කෝෂය.* එකොළොස් වන කාණ්ඩය. (2006). බත්තරමුල්ල: සංස්කෘතික දෙපාර්තමේන්තුව.

සෙනෙවිරත්න, නාමල් ජනනි. (2020). *සිතුවම් කලාව.* කොළඹ: පුරවිද්‍යා දෙපාර්තමේන්තුව.

සේනාධීර, කුලනාථ. (1973). *නූතන චිත්‍ර කලාවේ රසික සංකල්ප.* මීගමුව: ශාන්ත සේනාධීර

Arnold, Edwin. (1995). *The Light Of Asia*. New Delhi: Navrag

Balken" Debra Briker. (2005) *Abstract Expressionism Movement in Modern Art*. London: Tate.